**ශීර්ෂය 25 – සීමා නිර්ණය කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

-----------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

--------------------

ශීර්ෂය 25- සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 11 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.5 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හා 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ බවත්, | නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම | 2.4 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වනු පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වන ආකාරයට සලසා තිබෙන බවත්, | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරිම | 2.1 |
| 127(5) | ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් කාර්යාලයේදී දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරන බවත්, | 1. අධි ප්‍රතිපාදන සලසා තිබිම<br>2. අවම ලැබීම් සීමාවට ළගා නොවිම | 2.2<br>2.3 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

## 2.1 වත්කම් කළමනාකරණය

---

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාවේ කාර්යාලය විසින් එම වාර්තා 2018 ජුනි 08 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

---

කොමිෂන් සභාව ස්ථාපිත කිරීමෙන් පසු වාර්ෂික විසර්ජන පනත යටතේ 2017 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වියදම | 2017 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 31.64 | 18.96 | 12.68 | 40.08 |
| මූලධන | 1.20 | 0.67 | 0.53 | 44.17 |
| **එකතුව** | **32.84** | **19.63** | **13.21** | **40.23** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

---

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.මිලියන 20.83 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 8.37 ක් පමණක් උපයෝජනය කිරීම නිසා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 37 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 02501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1.50 | 0.56 | 0.40 | 0.06 | 4.00 | 0.79 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අවම ලැබීම් සීමාවට ළඟා නොවීම**

2016 අංක 24 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 02501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් කාර්යය වෙනුවෙන් අවම ලැබීම් සීමාව රු.මිලියන 0.40 ක් ලෙස සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලැබීම් වශයෙන් රු.මිලියන 0.06 ක් රැස්කර තිබුණි. ඒ අනුව රු.මිලියන 0.34 කින් එම සීමාවට ළඟා වි නොතිබුණි. 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8.1 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර 2018 මැයි 31 දිනට ප්‍රථම සීමා සංශෝධනය කළ හැකිව තිබුණත්, කොමිෂන් සභා කාර්යාලය විසින් 2018 ජුනි 08 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු.** | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 137(1) | 3,302,995 | සීමා නිර්ණය කමිටු වාර්තාව මුද්‍රණය කිරීමේදී මිල ගණන් අනුමත වීමට හා ඇණවුම ලබා දීමට පෙර වියදම සහතික කර චෙක්පත ලියා අත රඳවා ගෙන තිබුණි. |
| **(ආ) භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ** | | |
| **2017 නොවැම්බර් 02** දිනැති අංක **04/2017** දරන චක්‍රලේඛය | | |
| (i) 2.1 ඡේදය | 233,347 | 2017 දෙසැම්බර් 31 දිනට මුදල් පොත තුලනය කර එහි ශේෂය 2018 ජනවාරි 02 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, එම දිනය ප්‍රමාද කර 2018 ජනවාරි 16 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| (ii) 2.4 ඡේදය | 3,302,995 | 2017 වර්ෂය අවසානයේ මුදල් පොත පියවීමේදී අග්‍රිම ශේෂයෙන් කොටසක් රඳවා ගෙන තිබුණි. |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 10.99 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.1,098,815 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 07 | 02 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - |
| | **එකතුව** | **15** | **10** | **05** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ප්‍රමාණවත් නොවීම**

2017 වර්ෂයේ පුහුණු කිරීම් සඳහා රු.100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.33,000 ක් වැය කර නිලධාරීන් දෙදෙනෙකු පමණක් පුහුණු වීම සඳහා යොමු කර තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් පරිදි පුහුණුවීම් ලබා දීමට කොමිෂන් සභාවේ කාර්යාලය විසින් සැලැසුම් කර නොතිබුණි.